# කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

බඩුමිල, තෙල් මිල, අපරාධ, දූෂණ හා වර්ජන රැළි සියල්ල යටපත් කරමින්, අද ශ්‍රී ලංකාවේ උණුසුම්ම මාතෘකාව බවට පත්ව ඇත්තේ ජගත් මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාවට එරෙහිව ගෙනෙන්නට සූදානම් වන මානව හිමිකම් කඩකිරීම පිළිබඳ කෙටුම්පතයි. ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවල් විසින් ප්‍රධාන වී සම්පාදනය කොට ඇති මෙම කෙටුම්පත ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරන්නේ යුද්ධයේ අවසන් කාල සීමාවේදී කොටි සංවිධානයට එරෙහිව රජය ගෙනගිය සටනේදී මියගිය හෝ මරා දමන ලද සිවිල් වැසියන්ගේ හා ගරිල්ලා නායකයින්ගේ අවසානය කෙසේ සිදුවීද යන ප්‍රශ්නයයි.

මානවයන්ට ඇති හිමිකම් තීරණය කරනු ලබන්නේ මානවකයින්මය. ඔවුන් තමා පිළිබඳව පමණක් නොව ලොවේ සතුන්, පරිසරය, විශ්වය පිළිබඳවද තීරණය කරන මානවයාවේ. එහෙත් එම තීරණය හැම රටේම මානවයාට ගතහැකි තීරණයක් නොවේ. අද ලොවේ ප්‍රබල රටවල් විසින් මානවයාගේ හිමිකම් හා විනාශයන් පිළිබඳවද තීරණය ගනු ලබන ඉහළම මනසක් ඇති මානවයන් ලෙස හංවඩු ගසාගෙන ඇත. එහෙත් මානව හිමිකම් පිළිබඳව නොදන්නා මිනිසුන් ලොවේ සෑම තැනම ජිවත් වේ. තම තමන්ගේ දේශපාලන න්‍යායයන් අනුව මානව හිමිකම් වෙනස් කරගන්නා රටවල් අතරින් ප්‍රධාන තැන හිමිවන්නේ ඇමෙරිකාවටය. ඔවුන් තම රටේ ජනතාවගේ මානව හිමිකම් ඉහළින් තබාගෙන, අනෙක් රටවල ජනතාවගේ හිමිකම් සුන්නද්දූලි කර දමන්නට වුවද පසුබට නොවන ජාතියක් බවට පත්ව ඇත. ලොවේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳව රැව් පිළිරැව් දුන්නත් එල්ටීටීය එදා සාමාන්‍ය ජනතාවට විරුද්ධව ගෙනගිය මානව හිමිකම් පිළිබඳව අද සියලු දෙනාටම අමතකව ගොස් ඇත. එසේම එල්ටීටියට පසු හා පෙර මානව හිමිකම් කඩකළ අද විපක්ෂයව සිටින එජාපයට මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නයේදී අතීතය හා සියල්ල අමතකව ගොස් ඇති අන්දම පුදුමය. චන්ද්‍රිකා කුමාරතුංග චැනල් ෆෝ විඩියෝ පටිය පිළිබඳව කඳුළු සළන්නේ තමන්ට එක ඇසක් අහිමි කළ අනෙක් ඇසට පමණක් කඳුළු ඉතිරි කළ එල්ටීටීයට පක්ෂවද, නැත්තම් අහිංසක දෙමළ ජනතාවට පක්ෂවද යන්න තවමත් අපට තීරණය කළ නොහැක. එහෙත් එද තම මාමණ්ඩිය වූ සපුමල් කුමාරයා නොහොත් අනුරුද්ධ රත්වත්තේ ආරක්ෂක ආමාත්‍යවරයා ලවා යාපනයට බර අවි යොදා එල්ල කළ ප්‍රහාර වලදී සිවිල් වැසියන් මියගිය අන්දම ඇයටද අමතකව ගොස් ඇත.

රටක හෝ ලෝකයේ පාලනය කරන නායකයින-'ට තම බලය හමුවේ මානව හිමිකම් අමතකව යයි. එය මෑත කාලයේ බිහිවූ හිට්ලර් ගේ සිට බරක් ඔබාමා තෙක්ද, ඞී. එස්. ගේ සිට මහින්ද දක්වා ද පොදු කාරණයකි. බලය හමුවේ නායකයින්ට ජාතිය ආගම අමතකව ගොස් මානව හිමිකම් නැමැති සුදු රෙද්ද, රතු පාටින් නැහැවීමට වුවද ඔවුන් පසුබට නොවේ. බරක් ඔබාමාට "සොරි" යන වචනයෙන් සියල්ල සනුසුන් කළ හැකි වුවද ලංකාව වැනි කුඩා රටක පාලනය බාරගත් මහින්දට එසේ කළ නොහැක. ඉන්දියාව සතුටු කිරීමට සියල්ල සකස් කළ මහින්දට ඉන්දියාවද එරෙහිව යනවිට අමෙරිකාව පිළිබඳව කුමන කතාද? ... අපරාධ දූෂණ වංචා ඉහවහා ගිය, කොකා කෝලා, කේ. එෆ්. සී., ඊ-මේල් තහනම් කළ යුතු යැයි බෙරිහන් දෙන ජෝකර්ලා සිටින කැබිනට් මණ්ඩලයකින් මහින්දට මේ ගමන යා හැකිද ? වැර කරන ඇමතිවරු මන්ත්‍රිවරුන්ගේ ලැයිස්තුවක් සකස් කරන මෛත්‍රීපාල සිරිසේන අමාත්‍ය වරයාට රාජපක්ෂවරුන්ට එරෙහිව පෙත්සමක් ලැබුන-හොත් එය විභාග කළ හැකිද ?... ඒ සියල්ල ඔවුන්ටත් රටේ ජනතාවටත් බාරදී මා ලිපියෙන් සාකච්ඡා කිරීමට යන්නේ ජිනිවා පිළිබඳව නොවේ. සමහර විට මේ ලිපිය පළවන විට අප රට එයින් පරාජය ලබා සිටිය හැක. නැත්නම් සියල්ල සන්සුන් වී ජයග්‍රහණය කර තිබිය හැක. එහෙත් උතුරේ - දකුණේ ජිවත්වන දරිද්‍රතාවයෙන් පෙළෙන මිනිසුන්ට මේ සියල්ල කෙසේ වැදගත්කමක් වේද ?.. මේ ලිපිය තුළින් මා පාඨකයාට ලබාදෙන්නට අදහස් කරන්නේ වසර තිහක් තුළ යුද්ධයට සිරවී ජිවිතය දියකළ මිනිසුන් පිළිබඳවය. මියගිය මිනිසුන් අපේ දෑසට නොපෙනේ. එහෙත් කුසගින්න, වේදනාව, පීඩනය, මරණය හමුවේ ජාතිය ආගම අභිබවා ඒ පොළොව මත සිටගෙන රැකගැන්මට දරණ ජිවිතවල හා හුස්ම වල වටිනාකම පිළිබඳවය.



# පිනිවා නොගොස් යාපනයට ගියෙමි - 1

අප යාපනය ඇතුළු යුද්ධය පැවති අනෙක් ප්‍රදේශවලට යාමට තීරණය කළේ මධ්‍යම රාත්‍රියේය. එය ප්‍රදේශයක සිරි නරඹන සංචාරයක් නොවේ. ඉතිහාසය හා වර්තමානය එක්මුසු කළ, යුද්ධය විසින් විනාශ කළ පරිසරය දැකගැනීමේ අනුවේදනීය ගමනකි. අප පිරිස මැදවච්චියට ළඟා වන විට හිමිදිරි පාන්දර හතරට ආසන්න වී තිබිණි. අහස දැඩි අඳුර වෙලාගෙන සිටියේ වැහිවලා සළුවකිනි. යන්තම් වැහි බිඳු පොළොවට ඇඳ හැලේ. වනසතුන්ගේ කුරුල්ලන්ගේ කෑගැසීම් යන්තම් වන පෙතෙන් ඇසේ. ඒ නයින් මාර්ගයේ දෙපසට වනරොදින් වැසී දැඩි පාළු බවක් ලබාදී තිබුනත් අතරින් පතර පෙනෙන වගාබිම් හා ගෙවල් වල ගිනි එළි යන්තම් අපේ දෑසේ බිය පළවා හරී. දැන් අපගේ මූලික අවශ්‍යතාවය වී ඇත්තේ වැසිකිළියකි. එහෙත් පාරක් අයිනක නවත්වා එම අවශ්‍යතාවය ඉටුකරගැනීමට අප දෑරූ තැත ව්‍යවර්ථ කළේ කාන්තා පක්ෂයයි. ඔවුන් ඒ වෙනුවෙන් සැපයූ බොහෝ හේතු සාධක සාධාරණ කරගත් අපි තව ටික දුරක් ගොස් පහන් එළිය දැල්වෙන කුඩා තේ කඩයක් අසළ වාහනය නතර කෙරුවෙමු.

යන්තම් දිලිහෙන මලානික විදුලි එළියක් මතින් එම කඩය ඉදිරිපිට උඩුකය නිරාවරණය කොට, කොටට සරමක් ඇඳ හිටගෙන මිනිසෙකු සිටින අන්දම දුටු අපි ඒ අසළ වාහනය නතර කෙරෙවෙමු. කුඩා දරුවන් වාහනයේ තබා අප පමණක් වාහනයෙන් බැස ඔහු අසළට යනවිටම "ඔන්න සර්පයෙක්" යැයි අප සගයකු කෑ ගැසීය. තරුණ ජවයෙන් යුතුව, එහෙත් කෙසඟ සිරුරක් හිමි සිටි පුද්ගලයා තබා සිටගෙන සිටි තැනින් පොලු කෑල්ලක් රැගෙන කඩිනමින් එතැනට ආවේ කොරගසමිනි. එහෙත් සර්පයාට කලින් ඔහු ඉක්මන් විය. සර්පයා එතැනම තලා දැමූ ඔහු "මාපිලෙක්" යැයි කියමින් අප සමඟ සිනාසිණි. අප ඔහු සමඟ සිනා-සෙන විටත් දෑස් ගියේ කොර ගසන කකුල් දිශාවටය. ඔහු ඇවිදින්නේ එක් පාදයකට බොරු කකුලක් දමාගෙනය.

"අයියල කොහාටද ... යන්නේ"
"අපි යාපනේට යනව"

"දැන්ම තේ නම් ලැහැස්ති නැහැ තව පැයක් හමාරක් යනව තේ ලැහැස්ති කරන්න"

එහෙත් එවෙලේ තරමක් ලොකු බඩ ඉරිඟු හැලියක් තැම්බෙමින් තිබිණ.

"මේක තැම්බෙන්න තව වෙලායයි" ඔහු කීහ.
ඊට පසු අප අවශ්‍යතාවයන් පවසා ඔහු සමඟ තවත් කුළුපග විමු. වැසිකිළි අවශ්‍යතාවයන් සපුරාගත් අප ඔහු සමඟ තවත් කතා කළෙමු.

"ඔයා හමුදාවෙද හිටියද ?"
"ඔව් අයියෙ බට්ටෙකුට කකුල ගියානෙ. දැන් අයින්වෙලා මේ කඩේ දාගෙන ඉන්නව"

ලේ මාපිලා තලා දැමූ තැන තවමත් ඌ හුස්ම පොද රැකගැන්මට වලිකයි. කෝටු කෑලි දෙකකින් ඌ හිර කර කැලයට විසිකර දැමූ ඔහු ඉදිරි මාර්ගය පිළිබඳව විස්තර බිඳක් අප සමඟ පැවසීය.

මිනිස් සතුරා සමඟ සටන් කර පාදයක් අහිමි කරගත් ඔහුට මාපිලා කුමන සතුරෙක්ද ? මම ව්‍යංගයෙන් ඔහුට එසේ පැවසූ විට "මේ හැම තැනම සර්පයො ඉන්නව. උන්ගෙ පාඩුවෙ උන් ඉන්නව. අපේ පාඩුවේ අපි ඉන්නව නම්" ඔහු එසේ කියමින් සර්පයෙක් නිසා බිය වූ අප දෙස බලා නැවත සිනාසිණි. එම සත්වයාට කැලයට හිමි සත්ව හිමිකම් වනසා දැමූ අප ඔහුගෙන් සමුගෙන අඳුරේම ඉදිරියට ගමන් කළෙමු. හිමිදිරියේ පොළොවට පතිත වන හිරු කිරණ සෞම්‍යය එහෙත් අප වව්නියාවට ලඟාවන විට සැඩ හිරු රැසක් පොළොවට පතිතවෙමින් තිබිණි. රාත්‍රියේ වැටී ඇති පිණිබිඳු සැණෙකින් උරාගත් හිරුකිරණ හිමිදිරියේ අපේ ශරීරකුඩුද දහදිය වලින් නහවා තිබිණි. වව්නියාවට ඇතුළුවනවිටම තනා ඇති කොන්ක්‍රීට් තොරණ අසළ වාහනය නවතා තරමක් ගිමන් හැරියේ සාදාගෙන ආ තේ වතුර පානය කිරීමෙනි. මඟ දෙපස නිල්ලට දිලිසෙන තණබිම් හා කුඹුරු යායවල් තවමත් අවදිවී නැතිවා සේ නිසොල්මන්ව සිටී. අතරින් පතර අප පසුකර යන වාහනයක් හැරෙන්නට කළුපාට පීත්ත පටියක් සේ දිවෙන පාර දෙපස කිසිවෙකුත් නැත. එහෙත් ඉඳහිට අප පසුකර යන බයිසිකල් පාගමින් ඉදිරියට ඇදෙන මිනිසුන් අපේ වාහනය දෙස නැවත හැරී බලයි.

අප ඒ නයින් මාර්ගයේ වව්නියාව මහ නගරය තෙක් ඉදිරියට ඇඳුනෙමු. දැන් අපගේ අවශ්‍යතාවය වී ඇත්තේ උදේ ආහාරය සහ මුහුණ කට සෝදා ගෙන තරමක් ගිමන් හැරීමට අවශ්‍ය තැනකි. අපි වව්නියාව නගරයේ පිහිටි රජයේ විශ්‍රාම ශාලාව අසළ වාහනය නතර කර අවට සිසාරා බැලුවෙමු.

නගරය තරමක් දැන් මිනිසුන්ගෙන් පිරී පවතී. සුදු නිල ඇඳුම් ඇඳගත් බොහෝ දරුවන් පාසැල් යන්නේ බයිසිකලයෙනි. ඒ අසළම ඇති පාසැලක දෙමළ භාෂාවෙන් පාසැල ආරම්භ කිරීමට පෙර කුමක්දෝ කියවයි. කඩි රැලක් මෙන් එහෙමෙහෙ ඇවිදින හා බයිසිකල් පාගන මිනිසුන් තුළ කිසිදු සිනාවක් නැත. අප ඔවුන් සමඟ සිනාසුනද ඔවුන්ගේ මුහුණුවල සිනා-වක ඉරියව්වක්වත් නැත. එහෙත් බියමුසු හෝ සැකමුසු දෙනෙතින් නොව අමුත්තන් පිරිසක් බලන නිසාවෙන් ඔවුහු අප දෙස බලයි. අප විශ්‍රාම ශාලාවේ කාමරයක් කුලියට ගෙන මුහුණ කට සෝදා ගත්තෙමු. ඊට පසු ඒ අසළ ඇති සයිවර් කඩයට පා තැබුවේ උදෑසන ආහාර මිලදී ගැනීමටය.

තවත් කොටසක් ලබන සතියේ

GATEWAY
LAWYERS

▶ Advice on Legal Matters
▶ Business & Commercial Law
▶ Sale of Business
▶ Conveyancing
▶ Powers of Attorney
▶ Wills & Estate Planning
▶ Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia